2023(2024)/OL/33/S/Q/S-1

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ 2023(2024)

අනුහුරු ප්‍රශ්න පත්‍රය
Model Paper
மாதிரி வினாத்தாள்

# History
# ඉතිහාසය



Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 33 | S | I |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය- 2023 (2024)**

**ඉතිහාසය I**
**வரலாறு I**
**History I**

*පැය එකයි.*
*ஒரு மணித்தியாலம்*
*One Hours*

**උපදෙස්**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. කෝට්ටේ රාජ්‍ය සමයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා මෙරට ඉතිහාසය හැදෑරීමේ දී , වැදගත් කෘතියක් වන්නේ මින් කුමක් ද?

(1) කව්සිළුමිණ (2) සිදත් සඟරාව (3) රසවාහිණී (4) කොන්ස්තන්තීනු හටන

2. ශ්‍රී ලංකාවේ මුලින් ම රචනා වී ඇති සෙල්ලිපි රචනා කිරීම සඳහා යොදාගන ඇති භාෂාව වන්නේ,

(1) බ්‍රාහ්මී ය. (2) පාලි ය. (3) සංස්කෘත ය. (4) ප්‍රාකෘත ය.

3. කහාපණ කාසි හැඳින්වීමට යොදා ගත් තවත් නමකි.

(1) ඇතා හා ස්වස්තික (2) ධරණ. (3) මස්ස (4) ලැරීනය

4. අතීත රජවරුන් විදේශීය රාජ්‍යයන් සමඟ විවාහ සබඳතා ඇතිකර ගැනීම තුළින් අපේක්ෂා කළේ,

(1) මිත්‍ර සබඳතා ඇතිකර ගැනීම යි.
(2) ආර්ථික සබඳතා වැඩි දියුණු කරගැනීම යි .
(3) විශ්වසනීයත්වය වර්ධනය කරගැනීම යි.
(4) දේශපාලන බලය ස්ථාවරව පවත්වා ගැනීම යි.

5. පුරාණ කාලයට අයත් සාහිත්‍ය ,ආගමික තොරතුරු හා වංසකතා ලියා ඇත්තේ,

(1) පුස්කොළ පොත්වල ය. (2) සෙල්ලිපිවල ය. (3) රන්පත්වල ය. (4) තඹපත්වල ය.

6. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් මිටිය හා ඇඹරුම්ගල යන මෙවලම් සකස්කර ගැනීම සඳහා භාවිත කල පාෂාණ වර්ගය කුමක් ද?

(1) කහඳ (2) තිරිවානා (3) ගුරුගල් (4) කළුගල්

7. කණ්ඩලම කොත්ගල්කන්ද සෙල්ලිපියේ තොටබොජක ලෙස හඳුන්වා ඇත්තේ,

(1) ගෘහපතිවරයෙකි. (2) ගමිකවරයෙකි. (3) පරුමකවරයෙකි. (4) යුවරජෙකි.

8. ගංගා නිම්නයට පිටතින් වැව් බැම්මේ එක් කෙළවරක ජනාවාස ව්‍යාප්ත වූ යුගය කුමක් ද?

(1) ප්‍රාග් ඓතිහාසික ගල් යුගය (2) පූර්ව ඓතිහාසික යුගය
(3) මුල් ඓතිහාසික යුගය (4) ඓතිහාසික යුගය

9. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ගම, නගරය හා පුරය ලෙස බෙදා වෙන්කිරීමට යොදාගත් ප්‍රධාන සාධකය වන්නේ,

(1) ජනාවාසයේ තිබූ සම්පත් ප්‍රමාණය යි. (2) ජනාවාසයේ සිටි ජනසංඛ්‍යාව යි.
(3) ජනාවාසයේ තිබූ ගොඩනැගිලි ප්‍රමාණය යි. (4) ජනාවාසයට සපයා තිබූ ආරක්ෂාව යි.



(දෙවන පිටුව බලන්න)

10. දේවානම්පියතිස්ස රජතුමා විසින් එවකට සිටි ප්‍රාදේශීය පාලකයින් අතර සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවයට ආරාධනා කරන ලද ක්ෂත්‍රිය ජනපදය කුමක් ද?

(1) චන්දනගම (2) සුමනගම (3) විහාරවාපීගම (4) අනුරාධගම

11. ලංකා ඉතිහාසයේ සක්විති රජෙකු සේ පෙනී සිටීමට උත්සහ කළ පාලකයා වන්නේ,

(1) දුටුගැමුණු රජු ය. (2) මහසෙන් රජු ය. (3) මහා පැරකුම් රජු ය. (4) නිශ්ශංකමල්ල රජු ය.

12. ජනතාව විසින් නොයෙක් හේතු නිසා අතහැර දමන ලද වැව් ගම්මාන අතීතයේ දී හදුන්වා ඇත්තේ කෙසේ ද?

(1) කනත්ත නමිනි. (2) නිගම නමිනි. (3) ඔලගම් නමිනි. (4) පරික්ඛිතගම් නමිනි.

13. ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ මව් උරුමය අනුව රාජ්‍ය උරුමය ලබාගත් අවස්ථාවකට උදාහරණක් වන්නේ,

(1) දේවානම්පියතිස්ස රජුට පසු උත්තිය රජු බලයට පත් වීමයි.
(2) හයවන පැරකුම් රජුට පසුව ජයබාහු රජු බලයට පත්වීම යි.
(3) කාවන්තිස්ස රජුට පසුව දුටුගැමුණු රජු බලයට පත්වීම යි.
(4) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුට පසුව විජය රාජසිංහ රජු බලයට පත්වීම යි.

14. පැරණි ශ්‍රී ලංකාවේ පැවති කර්මාන්ත කිහිපයක් පහත වගුවේ (I) තීරුවේ දැක්වෙන අතර (II) තීරුවේ එම කර්මාන්ත පිළිබඳව තොරතුරු සඳහන්වන සෙල්ලිපි දක්වා ඇත.(I) තීරුවේ අනුපිළිවෙළ අනුව (II) තීරුවේ තොරතුරු ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| (I) තීරුව | (II) තීරුවේ |
|---|---|
| 1.කම්මල් කර්මාන්තය | A- මුතුගල්ල ලිපිය |
| 2.ස්වර්ණාභරණ කර්මාන්තය | B- වේගිරිය ලිපිය |
| 3.ඇත්දත් කර්මාන්තය | C- මණ්ඩගල ලිපිය |
| 4.රෙදි විවීමේ කර්මාන්තය | D- වෙහෙරකෙම ලිපිය |
| | E- නැට්ටුකන්ද ලිපිය |

(1) ABDC (2) ACBD (3) BACD (4) BDAC

15. වැවේ ඇතිවන ජල තරංග මගින් වැව් බැම්ම සේදීයාම වළක්වා ගැනීම සඳහා ඉදිකර ඇති තාක්ෂණික නිර්මාණය වන්නේ,

(1) මොහොල යි. (2) දියකැට පහණ යි. (3) රළපනාව යි. (4) පිටවාන යි.

16. අතීත ජනයා පරමාණුව නැමති මිනුම් ඒකකය භාවිත කර ඇත්තේ කුමක් මැනීම සදහා ද?

(1) දිග (2) බර (3) අවකාශය (4) කාලය

17. පැරණි ශ්‍රී ලාංකික ජනයා කිරිමඩු ශාන්තිකර්මය පවත්වන ලද්දේ,

(1) මිනිසුන්ගේ ග්‍රහ අපල සුව කරගැනීම සඳහා ය.
(2) මිනිසුන් අතර පැතිර ගිය වසංගත රෝග නැති කර ගැනීම සඳහා ය.
(3) දෙවියන් සඳහා පුද පූජා පැවැත්වීම සදහා ය.
(4) ගවයන්ගේ ආරක්ෂාව සඳහා ය.

18. පහත A,B,C හා D යන ප්‍රකාශ අතුරෙන් දුටුගැමුණු රජතුමා සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක් ද?

A- මාඝාත නීතිය පැනවීම
B- ශ්‍රී ලංකාව තුළ පළමු වතාවට මධ්‍යගත පාලනයක් ගොඩනැගීම
C- රෝහල් දහඅටක් ඉදිකරවීම
D රුවන්වැලි සෑයට වටදාගෙයක් කරවීම

(1) A හා C (2) A හා D (3) B හා D (4) C හා D



(තෙවන පිටුව බලන්න)

19. අතීත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ බදු නීතිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න

(1) නිශ්ශංකමල්ල රජතුමා විසින් හේන් වගා කරන්නන්ගෙන් කැති අඩ හා කෙටූ කනබ අය නමින් බදු අයකරන ලදි
(2) වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අයකළ බද්ද බොජකපති නම් වේ
(3) රජුට අයත් ඉඩම්වල වගා කරන්නන්ගෙන් අයකළ බද්ද දකපති නම් වේ
(4) මතරමජිබක යනු ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් අයකළ බදු වර්ගයක් වේ.

20. පොළොන්නරු යුගයේ දී පාණ්ඩ්‍ය වංශික රජ කුමරෙකු සමග විවාහ වූයේ,

(1) මිත්තා කුමරිය යි.
(2) අනුලා කුමරිය යි.
(3) ලීලාවතී කුමරිය යි.
(4) කල්‍යාණවතී කුමරිය යි.

21. ශ්‍රී ලංකාවේ සිටි වැදගත් රජවරුන් කිහිපදෙනෙකුගේ නම් පහත වගුවේ (I) තීරුවේ ද, ඔවුන්ගේ පාලන සමයේ සිදු වූ වැදගත් සිදුවීම් කීහිපයක් (II) තීරුවේ ද, දැක්වේ. (I) තීරුවේ පිළිවෙළට (II) තීරුව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| (I) තීරුව | (II) තීරුවේ |
|---|---|
| 1. බුවනෙකබාහු ආදිපාද<br>2. පළමු බුවනෙකබාහු<br>3. හතරවන පැරකුම්<br>4. වීර අලකේශ්වර | A- පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කරවීම<br>B- චෙන් හෝ සෙනවියාගේ ආක්‍රමණය<br>C- වන්නි නායකයින්ගේ කැරැල්ල මර්ධනය කිරීම<br>D- ගෝවින්දමලයේ බලකොටුවක් ඉදිකිරීම |

(1) A D C B (2) B C D A (3) D B A C (4) D C A B

22. ගම්පොළ රාජධානිය සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය තෝරන්න

(1) තුන්වන භුවනෙකබාහු මෙහි ආරම්භක පාලකයා වේ
(2) සමකාලීනව තවත් රාජධානි කිහිපයක් ක්‍රියාත්මක විම
(3) රාජ්‍ය පාලන කටයුතු සඳහා අලකේශ්වර පරපුරේ සහය හිමි වීම
(4) මාතෘ මූලික රාජ්‍ය උරුම සම්ප්‍රදාය ප්‍රචලිත වීම

23. පළමු විමලධර්මසූරිය රජු උඩරට නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගැනීම සඳහා,

(1) පෘතුගීසී ආක්‍රමණ මර්ධනය කර උඩරට රාජ්‍ය ආරක්ෂා කරගන්නා ලදි.
(2) උඩරට ආර්ථික කටයුතු සංවර්ධනය කරන ලදි.
(3) රෝමානු කතෝලික ආගම අතහැර බුදු දහම වැළඳ ගන්නා ලදි.
(4) බුරුම දේශයෙන් උපම්පදාව ගෙන එන ලදි.

24. මහනුවර යුගයේ දී ප්‍රාදේශිය පාලනය සමබන්ධයෙන් කටයුතු කරන ලද සංවිධානය කුමක් ද?

(1) මහවාසල (2) රටවසම (3) මහබද්ද (4) කෝරළය

25. කලා ශිල්ප අතරින් පුනරුද සමයේ ඉතා පුළුල් වෙනසකට ලක්වූයේ,

(1) චිත්‍ර කලාව යි. (2) ප්‍රතිමා කලාව යි. (3) සාහිත්‍ය කලාව යි. (4) ගෘහ නිර්මාණ ශිල්පය යි.

26. පෘතුගීසී විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළ සටන්කාමියෙකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි, කෝට්ටේ ධර්මපාල රජුගේ පියා කවුරුන් ද?

(1) ටිකිරි කුමරු (2) අම්බුලුගල කුමරු (3) සපුමල් කුමරු (4) වීදියබණ්ඩාර

27. ආර්ථික කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් වූ රාජ්‍ය නිර්බාධවාදී සංකල්පයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයකි.

(1) රජයේ මැදිහත්වීම ඉතා ඉහළ ය
(2) ආර්ථික කටයුතු සියල්ල රජය සතු ය.
(3) රජයේ මැදිහත්වීම අඩු ය.
(4) පෞද්ගලික අංශයට ඇති අවස්ථා සීමිත ය.


(හතරවන පිටුව බලන්න)

- පහත දැක්වෙන නිමැයුම් හා සම්බන්ධ තොරතුරු අධ්‍යයනය කොට අංක 28 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - වාෂ්ප එන්ජිම
B - රෝලර් යන්ත්‍රය
C- මියුල් යන්ත්‍රය
D - මැකඩම් ක්‍රමය
E- දුවන නඩාව
F - ආරක්ෂක ලාම්පුව

28. ඉහත දක්වා ඇති නිමැයුම් අතරින් පේෂ කර්මාන්තය හා සම්බන්ධ නිමැයුම් අයත් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) C හා D (3) C හා E (4) E හා F

29. ක්‍රි.ව. 1762 දී ලංකාවට පැමිණි ජෝන් පයිබස් ට හමු වූ උඩරට පාලකයා වන්නේ,

(1) දෙවන රාජසිංහ රජු ය. (2) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.
(3) රාජාධි රාජසිංහ රජු ය. (4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය.

30. ක්‍රි.ව. 1848 දෙවන නිදහස් අරගලයට හේතු වූ බදු ප්‍රතිපත්ති සැකසූ ආණ්ඩුකාරවරයා කවුරුන් ද?

(1) ෆ්‍රෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මෙයිට්ලන්ඩ් (3) රොබට් බ්‍රවුන්රිග් (4) ටොරින්ටන්

31. මදුරාසි පාලනය යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත්කරන ලද නිලධාරියා කවුරුන් ද?

(1) කලෙක්ටර්වරයා (2) අවුමිල්දාර්වරයා (3) රෙසිඩන්ට්වරයා (4) ආණ්ඩුකාරවරයා

32. අනගාරික ධර්මපාලතුමා , ආරුමුග නාවලර්තුමා, සිද්දිලෙබ්බේ යන නායකයන්ගේ ක්‍රියාකාරිත්වය නිසා ශ්‍රී ලංකාවේ පුනර්ජීවනයක් ඇති වූයේ ,

(1) දේශපාලන ක්ෂේත්‍රයේ ය. (2) ආගමික ක්ෂේත්‍රයේ ය.
(3) ආර්ථික ක්ෂේත්‍රයේ ය. (4) සමාජීය ක්ෂේත්‍රයේ ය.

33. පහත සඳහන් A , B , C , D අතරින් කෝල්බෲක් මැකලම් හා සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලට අයත් ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

A - සීමිත ඡන්දබලය හඳුන්වා දීම
B - නිලනොලත් සාමාජික පිරිස බහුතරය බවට පත්වීම
C - විධායක කාරකසභා ක්‍රමය හඳුන්වා දීම
D - ද්විමණ්ඩල පාර්ලිමේන්තුවක් ඇතිකිරීම

(1) A හා D (2) C හා D (3) C හා E (4) E හා F

- පහත වගුවේ A සිට J දක්වා වූ තොරතුරු ඇසුරෙන් 34 සහ 35 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

| ජලාශය | වේල්ල බඳින ලද ස්ථානය | ආධාර ලබාදුන් රට |
|---|---|---|
| A - කොත්මලේ | D - මිණිපේ අමුණට ඉහලින් | G - බ්‍රිතාන්‍ය |
| B - වික්ටෝරියා | E - කඩදොර නම් ස්ථානය | H - බටහිර ජර්මනිය |
| C - රන්දෙණිගල | F - පොල්ගොල්ල බැම්මට පහළින් | J - ස්විඩනය |

34. වික්ටෝරියා ජලාශය හා සම්බන්ධ පිළිතුර වන්නේ කුමක් ද?

(1) D හා H (2) E හා G (3) F හා G (4) F හා J

35. රන්දෙණිගල ජලාශය හා සම්බන්ධ පිළිතුර කුමක් ද?

(1) D හා H (2) E හා G (3) F හා G (4) F හා J



(පස්වන පිටුව බලන්න)

- පහත A හා B ප්‍රකාශ කියවා අංක 36 හා 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A - නියෝජනයක් නැතිනම් බදුත් නැත

B - සාමය, ඉඩම් හා ආහාර

36. ඇමෙරිකානු නිදහස් සටන සම්බන්ධයෙන්,

(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (4) B අසතය වන අතර A සත්‍ය වේ..

37. රුසියානු විප්ලවය සම්බන්ධයෙන්

(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (4) B අසතය වන අතර A සත්‍ය වේ.

- පහත A, B , C. හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර, අංක 38 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A- 1. රාජාණ්ඩුව
2. සමූහ ගොවිපල

B - 1. සරයේවෝ සිද්ධිය
2. රතු ඉන්දියානුවෝ

C- 1. පළමු මහ ලෝක යුද්ධය
2. ජාතින්ගේ සංගමය

D - 1. බල කඳවුරු දෙකක් බිහිවීම
2. දෙවන ලෝක මහා සංග්‍රාමය

38. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොදැක්වෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

39. දෙවැන්න ඇතිවීමට පළමුවැන්න හේතුවක් වූ බව දැක්වෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

40.දෙවැන්නෙහි ප්‍රතිඵලයක් ලෙස පළමු වැන්න දැක්වෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

*****

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 33 | S | II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය- 2023 (2024)**

**ඉතිහාසය II**
**வரலாறு II**
**History II**

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - **මිනිත්තු** 10 **යි.** | **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න** |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் | |
| Additional Reading Time | – 10 minutes | |

- **I** කොටසේ ප්‍රශ්න අංක **1 අනිවාර්යය වේ.**
- **II** කොටසින් ප්‍රශ්න **හතරකට** ද, **III** කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

1. (අ) (I) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

මැණික් ගඟ, මල්වතු ඔය, මාදුරුඔය ජලාශය, පදවිය වැව, කුරුණෑගල, ගන්නෝරුව , හලාවත ලංකාපටුන , ඌරාතොට, රයිගම, පොතාන, කල්පිටිය (ලකුණු 12)

(II) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.


කළු මුහුද, ජිනෝවා, කැලිකට්, සුමාත්‍රා, නාගසාකි, පෘතුගාලය (ලකුණු 06)

(ආ) (i) පහත A , B , C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න .

A- ශ්‍රී ලංකාවට ගොඩබසින ලද පළමු පෘතුගීසි ජාතිකයා
B- ශ්‍රී ලංකාවේ බලයට පත් අවසාන නායක්කර් වංශික පාලකයා
C- අනුරාධපුර යුගයේ දී උණ රෝගීන් සඳහා ඉදිකරවන ලද රෝහල
D- කියුබානු විප්ලවය සිදුවන අවධියේ එහි පාලකයා (ලකුණු 04 )

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න

A රූපය



(II) 1. යාබද A රූපයේ දැක්වෙන ප්‍රතිමාවෙන් දැක්වෙන පාලකයා කවුරුන් ද?

2. එතුමා තානාපති සබඳතා පැවැත්වූ රට කුමක් ද?

3. තානාපති පිරිස එරටින් ශ්‍රී ලංකාවට ගෙන එන ලද්දේ මොනවා ද?

4. වර්තමානයේ දී මෙම ප්‍රතිමාව දැක ගත හැකි ස්ථානය කුමක් ද?

(ලකුණු 04)



(දෙවන පිටුව බලන්න)

B රූපය



(iii) 1. යාබද B රූපයේ දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?

2. ඔහු කිනම් ජාතිකයෙක් ද?

3. ඔහු විසින් අනුගමනය කරන ලද දේශපාලන දර්ශනය කුමක් ද?

4. එතුමා විසින් බලයෙන් පහකරන ලද පාලකයා කවුරුන් ද?

(ලකුණු 04)

## II **කොටස**

02. (I) ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වර්ග **තුනක්** නම් කරන්න. **(ලකුණු 03)**

(II) පහත A B C හා D යටතේ දක්වා ඇති එක් එක් ප්‍රකාශයට අදාළ තොරතුරු වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A- දීපවංසය රචනා කිරීමට තොරතුරු ලබාගත් ඊට පෙර රචනා වූ කෘතියකි

B- මහාවංශයට පාලි භාෂාවෙන් රචනා කරන ලද ටීකාව

C- ශ්‍රී ලංකාවේ පැරණිතම සෙල්ලිපි වර්ගය

D- ඉන්ඩිකා කෘතිය රචනා කරන ලද ග්‍රීක ජාතිකයා

(සීහලට්ඨකතා මහාවංසය , ඇරිස්ටෝටල් , වංසත්තප්පකාසිනී , ලෙන් ලිපි , මෙගස්තිනිස් , ගිරි ලිපි)

(ලකුණු 04)

(III) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී මහාවංශයේ ඇති වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න (ලකුණු 05)

(IV) ඉතිහාසය හැදෑරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වැදගත්වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න (ලකුණු 06)

03. (I) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ජීවත් වූ තෙත් කලාපීය ලෙන් වාසස්ථාන **තුනක්** නම් කරන්න (ලකුණු 03)

(II) ප්ලයිස්ටොසීන යුගයට අයත් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ පැරණිතම සාධක හමුවන ප්‍රදේශ **දෙක** නම් කරන්න (ලකුණු 04)

(III) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයාගේ ජීවන රටාවේ කැපීපෙනෙන ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න (ලකුණු 05)

(IV) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ සුසාන ක්‍රම **තුනක්** දක්වා ඒ පිළිබඳ විස්තර කරන්න (ලකුණු 06)

04. (I) රාජ්‍ය පාලනය සම්බන්ධ ප්‍රධාන ආයතන **තුන** නම් කරන්න. (ලකුණු 03)

(II) බලය විකේන්ද්‍රගතව පැවති අවධියේ දී ගමික ගෙන් ඉටු වූ කාර්යයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(III) අතීත පාලකයන් තමන්ගෙන් රටවැසියාට ඉටු විය යුතුයැයි අපේක්ෂා කළ යුතුකම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(IV) ශ්‍රී ලංකා ඉතිහාසයේ කීර්තිමත් පාලකයෙකු වූ වසභ රජතුමාගෙන් ඉටු වූ සේවාවන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

05 (I) පහත රාජධානිවල ආරම්භක පාලකයන් **අනුපිළිවෙළින්** නම් කරන්න.

A- දඹදෙණිය
B- ගම්පොළ
C- මහනුවර (ලකුණු 03)

(II) පහත A සිට D දක්වා අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A- දෙවන නාගරීකරණ අවධියේ දී ඊජිප්තුව සමග සෘජු වෙළෙඳ සබඳතා පැවැත්වීමට උත්සාහ කළ පාලකයා
B- ගම්පොළ සිව්වන භුවනෙකබාහු රජුට සමකාලීන පාලකයෙකු වූ පස්වන පැරකුම් රජුගේ පාලන මධ්‍යස්ථානය
C- හය වන භුවනෙකබාහු රජුගේ රාජ්‍ය සමය ආරම්භක අවධියේ දී පස්යොදුන් කෝරලය ප්‍රදේශයේ ඇති වූ කැරැල්ල
D- විජයබාකොල්ලය සිදු වූ රාජධානි සමය (ලකුණු 04)

(III) පොලොන්නරුව රාජධානිය බිඳවැටීමට බලපෑ සාධක **දෙකක්** විස්තර කරන්න.
(ලකුණු 05)

(IV) දෙවන පැරකුම් රාජ්‍ය සමයේ ඇති වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් විස්තර කරන්න
(ලකුණු 06)

06 (I) ආසියානු මහද්වීපය තුළ දේශපාලන බලය අත්පත් කරගත් යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න.
(ලකුණු 03)

(II) ඉංග්‍රීසීන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න (ලකුණු 04)

(III) මහනුවර රාජධානිය අල්ලා ගැනීම කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

(IV) ක්‍රි.ව 1818 නිදහස් අරගලයට බලපෑ හේතු **තුනක්** දක්වා විස්තර කරන්න. (ලකුණු 06)

07 (I) ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය වෙත පෙත්සම් ඉදිරිපත් කළ ශ්‍රී ලාංකික සංවිධාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(II) කෝල්බෲක් කොමිසම විසින් ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලද ප්‍රතිසංස්කරණ **හතරක්** නම්කරන්න
(ලකුණු 04)

(III) බ්‍රිතාන්‍යය පාලනය නිසා ශ්‍රී ලංකාවේ සමාජීය ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න.
(ලකුණු 05)

(IV) ක්‍රි.ව 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වා දෙනු ලැබූ නව ඡන්ද විමසීම් ක්‍රම **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

III කොටස

08 (I) පුනරුද සමයේ , ඉතාලියේ බිහි වූ ගත් කතුවරුන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03)

(II) පුනරුද සමය හා සම්බන්ධ පහත ප්‍රශ්න වලට පිළිතුරු **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A- පියේටා ප්‍රතිමාවේ නිර්මාපකයා
B- ගැලීලියෝ ගැලිලි හැඳින් වූ අන්වර්ථ නාමය
C- ප්‍රථම වරට, පෘතුවිය ගෝලාකාර බව ප්‍රකාශ කළ පුද්ගලයා
D- ලෙඩ රෝගවලට තුඩුදුන් හේතු අත්හදා බැලූ වෛද්‍යවරයා

(ලකුණු 04)


(හතරවන පිටුව බලන්න)

(III) පුනරුදය ගෝලීය ප්‍රවනතාවයක් බවට පත්වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)


(IV) පුනරුදයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)


09 (I) බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු නිධි බහුල ප්‍රදේශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(II) කාර්මික විප්ලවය අවධියේ බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු පතල් කාර්මිකයන් මුහුණ දුන් අභියෝග **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(III) කාර්මික විප්ලවයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ සිදු වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න (ලකුණු 05)

(IV) කාර්මික විප්ලවය නිසා ඇති වූ හිතකර බලපෑම් **එකක්** හා අහිතකර බලපෑම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 06)


N


N
Indian Ocean
Africa

2023(2024)/OL/33/S/A/S-1

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ 2023(2024)

“

අනුහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය
Answer Sheet For the Model Paper
மாதிரி வினாத்தாளுக்கான விடைத்தாள்

# History

# ඉතිහාසය



අධ්‍යාපන අමාත්‍යංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව


# පිළිතුරු පත්‍රය

## I පත්‍රය


| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 4 | 11 | 4 | 21 | 4 | 31 | 3 |
| 2 | 1 | 12 | 3 | 22 | 1 | 32 | 2 |
| 3 | 2 | 13 | 2 | 23 | 3 | 33 | 1 |
| 4 | 4 | 14 | 2 | 24 | 2 | 34 | 3 |
| 5 | 1 | 15 | 3 | 25 | 4 | 35 | 1 |
| 6 | 4 | 16 | 1 | 26 | 4 | 36 | 4 |
| 7 | 3 | 17 | 4 | 27 | 3 | 37 | 3 |
| 8 | 3 | 18 | 2 | 28 | 3 | 38 | 2 |
| 9 | 2 | 19 | 1 | 29 | 2 | 39 | 3 |
| 10 | 1 | 20 | 1 | 30 | 4 | 40 | 4 |

1.

(අ) (I) ලංකා සිතියම (ලකුණු12)




(II) ලෝක සිතියම (ලකුණු 06)




(ආ) (i) II පත්‍රය

A- ලොරෙන්සෝ ද අල්මේදා
B- ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
C- උපසග්ගරෝගනාස
D- පිදෙල් කැස්ත්‍රෝ (ලකුණු 04 )

(II)
1. භාතිකාභය රජතුමා
2. රෝමය/රෝමාණුක දේශය
3. වීදුරු පබළු
4. රුවන්වැලි සෑ මළුව

(ලකුණු 04)

(iii)
1. වී.අයි.ලෙනින්
2. රුසියන්/රුසියානු
3. සමාජවාදය/සමාජවාදී දර්ශනය
4. කෙරෙන්ස්කි (ලකුණු 04)

II කොටස

02. (I) අභිලේඛන/ කාසි / නටඹුන්/ චිත්‍ර මූර්ති කැටයම්/ පුරාවස්තු (ලකුණු 03)

(II)

A- සීහලට්ඨකතා මහාවංසය

B- වංසත්තප්පකාසිනී

C- ලෙන් ලිපි

D- මෙගස්තිනිස් (ලකුණු 04)

(III) 1.ලංකාවේ ඉතිහාසය මහාවංසය තුළ අඛණ්ඩ ව ලියැවී තිබීම

මහානාම හිමියන් මහාවංසයේ මුල් කොටස ලිවීමෙන් පසු වෙනත් කතුවරුන් විසින් වරින් වර ඒ ඒ කාලවකවානු පිළිබඳ තොරතුරු ඇතුළත් කොට අඛණ්ඩ කෘතියක් වශයෙන් මහාවංසය තවත් කොටස් කිහිපයක් වශයෙන් දීර්ඝ කර රචනා කර තිබීම

2. මහාවංසයේ සඳහන් ඇතැම් ඓතිහාසික සිදුවීම් ශිලා ලිපි හා වෙනත් මූලාශ්‍රය මගින් තහවුරු වීම

3. ශ්‍රී ලංකාවේ දේශපාලන සමාජ සංස්කෘතික හා ආර්ථික වැනි අංශවලට අදාළ ව බොහෝ තොරතුරු අනාවරණය කර ගත හැකිවීම (ලකුණු 05)

(IV) 1. සාහිත්‍ය මූලාශ්‍රයට වඩා විශ්වාසදායී තොරතුරු ලබාගත හැකි වීම

පුරාවිද්‍යා මූලාශ්‍රය බොහෝ විට ඓතිහාසික සිදුවීම්වලට සමකාලීන ඒවා වීම,සාහිත්‍යය මූලාශ්‍රය නැවත නැවත පිටපත් කිරීම සිදුවන බැවින් කරුණු ගිලිහී යාම, නව කරුණු එකතු වීම, කතෘවරුන්ගේ රුචි අරුචි කම් මූලාශ්‍රයවලට ඇතුළු වීම ආදිය සිදු විය හැකි වීම

2. සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු පුරාවිද්‍යාත්මක වශයෙන් සනාථ කරගැනීමට සාක්ෂි වශයෙන් යොදාගත හැකිවීම.

3. සාහිත්‍ය මූලාශ්‍රයවල අඩු පාඩු පුරවා ගැනීමට

4. ශ්‍රී ලංකාවේ දේශපාලන සමාජ සංස්කෘතික හා ආර්ථික වැනි අංශවලට අදාළ ව නව තොරතුරු අනාවරණය කර ගත හැකිවීම (ලකුණු 06)

03. (I) කිතුල්ගල බෙලිලෙන/ පාහියන්ගල/ කුරුවිට බටදොඹ ලෙන ආදී (ලකුණු 03)

(II) 1. රත්නපුර සහ එහි අවට ප්‍රදේශවල පිහිටි මැණික් පතල්

2. ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයේ ඉරණමඩු සැකැස්ම (ලකුණු 04)

(III) 1. දඩයම් කිරීමෙන් සහ තැන තැන ඇවිද ආහාරයට ගත හැකි ස්වාභාවික දේ එකතු කර ගනිමින් ජීවිකාව පවත්වා ගෙන යාම

2. වර්ෂයේ වැඩි කාලයක් සංචාරක ජීවිතයක් ගත කිරීම

3. එළිමහනේ ජීවත්වීමට වැඩි කැමැත්තක් දැක්වීම හා වර්ෂාධික කාලවල දී ස්වාභාවික ගල්ගුහාවල ජීවත් වීම

4. කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී සිටීම

5. මියගිය ඥාතීන්ගේ මළසිරුරු ගුහා ඇතුළත වළ දැමීම හා අවමංගල අභිචාර විධි අනුගමනය (ලකුණු 05)

(IV) මැටි ඔරු සුසානය, ශිලා මංජුසා සොහොන් හා හරණි සුසාන පිළිබඳව උදාහරණ සපයමින් හා ඒවා නිපදවාගත් අයුරු භාවිත කළ අයුරු හා එහිදී අනුගමනය කළ අභිචාර විධි පිළිබඳව විස්තර කර තිබිය යුතුය (ලකුණු 06)

04. (I) ව්‍යවස්ථාදායකය/ විධායකය / අධිකරණය (ලකුණු 03)

(II)1. ගමේ වැව ඉදිකිරීම හා නඩත්තුව ජලය බෙදා හැරීම

2.ගමේ සුළු ආරවුල් විසඳීම

3. ගම නියෝජනය කරමින් සහභාගී වීම (භාණ්ඩ හුවමාරුව , ආවාහ විවාහ කටයුතු ,ගම් අතර ඇතිවන ආරවුල් විසඳීම ) (ලකුණු 04)

(III) 1. රට ආර්ථික වශයෙන් දියුණු කිරීම
2. රටවැසියාට ආරක්ෂාව සැපයීම
3. රටවැසියාගේ ආධ්‍යාත්මික සංවර්ධනය (ලකුණු 05)

(IV) 1.පරිපාලන කටයුතු විධිමත් කිරීම (ලංකාව ආස්ථාන වලට බෙදා ඒවා පාලනයට ඇමතිවරු පත් කිරීම)
2. මහ වැව් ඉදිකිරීම ආරම්භ කිරීම
දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණ ගංගා නිම්නයේ ඇති වූ ආහාර හිගයක් හේතුවෙන් මෙරට නිපදවන ධාන්‍ය සඳහා විශාල ඉල්ලුමක් ඇති වීම යි. නව ජලාශ ඉදි කිරීමට රජයේ මුදල් වැය කිරීමට වසභ රජතුමා විසින් ගන්නා ලද තීරණය එවක පැන නැගුණු අන්තර්ජාතික කලාපීය අවශ්‍යතාවකට මුහුණ දීමසඳහා ගත් සාධනීය වූත් දුරදක්නා වූත් තීරණයක් බව විස්තර කිරීම
3. ආගමික අනුග්‍රහය
බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය
භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය සපයා ගැනීමට විහාරවලට දීමනා ලබා දීම (ලකුණු 06)

05 (I)

A- දඹදෙණිය- තුන්වන විජයබාහු/වන්නි විජයබාහු
B- ගම්පොළ - හතරවන භුවනෙකබාහු
C- මහනුවර - සේනාසම්මත වික්‍රමබාහු (ලකුණු 03)

(II)

A- පළමු භුවනෙකබාහු
B- දැදිගම
C- සිංහල සංගය/සිංහල පෙරළිය/සිංහල කෝඩේ
D- කෝට්ටේ (ලකුණු 04)

(III) 1. දුර්වල පාලකයන් බලයට පත් වීම.
2. කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය
3. ආර්ථික පරිහානිය
4. කාලිංග මාඝගේ ආක්‍රමණය (ලකුණු 05)

(IV) 1. මාඝගේ පාලනයෙන් රජ රට මුදවා ගැනීම
2. ජාවක චන්ද්‍රභානු ගේ ආක්‍රමණ දෙකක් මර්ධනය කිරීම
3. දේව පතිරාජ නම් ඇමතිවරයා යොදවා ආර්ථික, ආගමික හා අධ්‍යාපනික අංශවල ද ප්‍රබල දියුණුවක් ඇති කිරීම
4. පොත පත රචනා කිරීම හා පොත්පත් රචනා කිරීමට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබාදීම
5. දඹදෙණියේ දළදා මාළිගයක් ඉදිකිරීම (ලකුණු 06)

06 (I) පෘතුගීසි ජාතිකයන්/ ලන්දේසී ජාතිකයන් / ඉංග්‍රීසි ජාතිකයන් / ප්‍රංශවරුන් (ලකුණු 03)

(II) 1. ශ්‍රී ලංකාවේ පිහිටීම

- ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහණ ලා පිහිටා තිබීම
- ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසී නාවික බලය රැක ගැනීමට එම වරායේ පිහිටීම වැදගත් වීම
- ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාමල වරාය යොද ගත හැකි වීම

2. ශ්‍රී ලංකාවෙන් කුරුඳු ඇතුළු වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම
(වෙළෙදාම් කටයුතු වලදී ඇති වැදගත් කම) (ලකුණු 04)

(III)

1. උඩරට ස්වාධීන රාජ්‍යයක් පැවතීම මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසි පාලනයට බාධාවක් වීම
2. මුහුදුබඩ ප්‍රදේශ ආරක්ෂා කිරීමට හමුද යෙදවීමට අමතරව අභ්‍යන්තර දේශ සීමා ආරක්ෂාවට ද තම හමුද යෙදවිය යුතු වූ හෙයින් විශාල වියදමක් දැරීමට ඉංග්‍රීසීන්ට සිදුවීම
3. මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් පවා උඩරට රජු තම රජු ලෙස සැලකීම
4. මුහුදුබඩ ප්‍රදේශවල කැරලි ඇති වූ විට උඩරට රජු කැරලිකරුවන්ට ආධාර ලබාදීම

5. උඩරට පාලකයන් ප්‍රංශ ජාතීන්ගෙන් ආධාර ඉල්ලා සිටියහොත් එය තම පාලනයට තර්ජනයක් වන බව ඉංග්‍රීසීන් කල්පනා කිරීම
6. කොළඹ පාලන මධ්‍යස්ථානයේ සිට තම ප්‍රධාන නාවික මධ්‍යස්ථානය වූ ත්‍රිකුණාමලය සමග ගොඩබිමෙන් සබඳතා පැවැත්වීම සඳහා රාජ්‍යයේ බල ප්‍රදේශය හරහා ගමන් කළ යුතු ව තිබුණි. මේ සඳහා මාර්ගයක් ඉදි කර ගැනීමටත් ඉංග්‍රීසීන්ට අවශ්‍ය වූ අතර උඩරට පාලකයන් ඊට විරුද්ධ වීම

(ලකුණු 05)

(IV) 1. නිදහස අහිමිවීම හා රජෙකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල
2. ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු වීම
3. උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම (ලකුණු 06)

07 (I) පහත රට නිෂ්පාදන සංගමය, හලාවත සංගමය , යාපන සංගමය (ලකුණු 03)

(II) 1. ව්‍යවස්ථාදයක හා විධායක සභා පිහිටුවීම.
2. උඩරට හා පහතරට පළාත් සඳහා ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වා දීම.
3. දිවයින පළාත් පහකට බෙදීම.
4. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
5. රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම. (ලකුණු 04)

(III) 1. පැරණි ප්‍රභූ පන්තිය අභාවයට ගොස් නව මධ්‍යම පන්තියක් බිහිවීම
3. සාම්ප්‍රදායික ධනෝපායන මාර්ග වෙනුවට ධනය උපයාගත හැකි අලුත් මාර්ග රැසක් විවෘත වීම
4. නව ව්‍යාපාරවලට මුදල් යොදවා ධනය උපයාගත් ස්වදේශීය ධනවත්තු පිරිසක් බිහි වූහ. මෙම ධනවත් පන්තිය තම දූ දරුවන්ට මෙරට දී මෙන් ම විදේශයන්හි ද උසස් අධ්‍යාපනයක් ලබා දීමට ධනය වැයකිරීම
5. නීතිඥ වෛද්‍ය, ඉංජිනේරු,මිනින්දෝරු, ලිපිකාර, සිවිල් සේවය වැනි අලුත් රැකියා අවස්ථා ජනිත වීම
6. නව මධ්‍යම පන්තියක් බිහිවීම
7. කම්කරු පන්තියක් බිහි වීම (ලකුණු 05)

(IV) 1.ජනාධිපතිවරණය

ජනාධිපතිවරණයක දී ශ්‍රී ලංකාව ම එක ම ඡන්ද කොට්ඨාසයක් බවට පත් වේ.ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරයක් හෙවත් 50% ඉක්මවූ ඡන්ද ප්‍රමාණයක් ලබාගන්නා අපේක්ෂකයා ජයග්‍රහණය කරයි.

2.සමානුපාතික නියෝජන ක්‍රමය

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් හා පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගනු ලබන සියලු මැතිවරණවල දී සමානුපාතික නියෝජන ක්‍රමය යොද ගැනේ. මෙම නියෝජන ක්‍රමයට අනුව අපේක්ෂකයන් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වේ. විවිධ ඡන්ද කොට්ඨාස සඳහා තෝරා ගන්නා මන්ත්‍රීවරුන් ගණන මැතිවරණයට පෙර ප්‍රකාශ කෙරෙන අතර ඡන්ද දායකයන් ඡන්දය භාවිත කිරීමේ දී අදාළ පක්ෂයට ඡන්දය ලබා දී ඉදිරිපත් කර ඇති අපේක්ෂකයාට මනාපය සටහන් කළ යුතු ය. එහි දී ඒ ඒ පක්ෂ ලබා ගත් ඡන්ද සංඛ්‍යාවට අනුපාතිකව පක්ෂයට හිමි ආසන ගණන තීරණය වන අතර අපේක්ෂකයන් ලබා ගත් මනාප ප්‍රමාණය අනුව ඒ ඒ අපේක්ෂකයාට ජයග්‍රහණය හිමි වේ.

3. ජනමත විචාරණය

ජාතික වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් සෘජුව ම මහජන මතය ලබා ගන්නා ක්‍රමයක් ලෙස ජනමත විචාරණය හැඳින්විය හැකි ය. මෙහි දී එක් නියමිත කරුණක් සඳහා තම අභිමතය ‘ඔව්’ හෝ ‘නැත’ ලෙස ප්‍රකාශ කෙරෙන ප්‍රශ්නයකට පිළිතුරු ලබා ගැනීම සිදු වේ

(ලකුණු 06)

08 (I) ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ (ලකුණු 03)

(II)

A- මයිකල් ආන්ජලෝ

B- අත්හද බැලීමේ පියා

C- නිකලස් කොපර්නිකස්

D- වෛද්‍ය පැරසල්සස් (ලකුණු 04)

(III) 1. දේශ ගවේෂණ ව්‍යාපාරය දියුණු වීම

2. මුද්‍රණ කර්මාන්තය ලොව පුරා පැතිරයාම

3. යටත් විජිතවල ධනවතුන්ගේ දූ දරුවන් අධ්‍යාපන කටයුතු සඳහා යුරෝපයට යාම

(ලකුණු 05)

(IV) 1. රාජාණ්ඩු ආණ්ඩු ක්‍රමය බිඳවැටී පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් මෙරටට ලැබීම.

2. උඩරට රාජධානි සමයේ සිටි අධිකාරම්වරු, දිසාවෙවරුන්, මොහොට්ටාලවරු, හා කෝරාළවරුන් වැනි සාම්ප්‍රදායික නිලධාරි පන්තිය වෙනුවට අලුත් පාලන ක්‍රමයට ගැළපෙන නව නිලධාරි පන්තියක් මෙන් ම පරිපාලන ආයතන පද්ධතියක් ද බිහි වීම

3. පැරණි නීති රීති පද්ධතිය අභාවයට ගොස් රෝම ලන්දේසි නීතිය දායාද වීම

(ලකුණු 06)

09 (I) දකුණු වේල්ස්, යෝක්ෂයර් , ලැන්කැෂයර් (ලකුණු 03)

(II) 1. කැණීමේ දී ආකරවල එකතු වන ජලය ඉවත් කිරීම

2. ගැඹුරට කැණීමේ දී ආකර පතුලේ විෂ වායු තිබීම

3. ආකර පතුලේ උෂ්ණත්වය වැඩි වීම

4. ආකර තුළට ආලෝකය සැපයීම (ලකුණු 02)

(III) 1. රබර්, පොල් වැනි බෝග ආශ්‍රිතව විවිධ කර්මාන්ත ඇරඹීම සිදු වූ අතර ඒවා සඳහා යන්ත්‍ර සූත්‍ර බ්‍රිතාන්‍යයෙන් ගෙන්වීම

2. කම්කරු පන්තිය බිහි වීම

3. වතු හිමියන් හා කර්මාන්තශාලා හිමියන් ධනවතුන් බවට පත් වූ අතර ඔවුහු උගත් ධනවත් මධ්‍යම පන්තියක් ලෙස වෙනම ම සංවිධානය වීම

4. ධනවාදී ආර්ථික ක්‍රමය ලංකාවේ වර්ධනය වූ අතර ආනයන අපනයන වෙළෙඳාම ප්‍රමුඛත්වය ගැනීම

5. ලංකාවේ පැවති ග්‍රාමීය ස්වංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම

6. ලංකාවේ බැංකු ආරම්භ වීම

7. මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදිවීම හා ප්‍රවාහන කටයුතු දියුණු වීම

8. සංනිවේදන කටයුතු දියුණු වීම (ලකුණු 05)

(IV) හිතකර

1. මිනිසුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු වීම

- කර්මාන්තශාලාවල විශාල ප්‍රමාණයකින් නිෂ්පාදනය කළ කාර්මික භාණ්ඩ ජනතාවට දැරිය හැකි මිලකට ලබාගත හැකි වීම
- රැකීරක්ෂා සුලභ වීම

අහිතකර

1.නාගරීකරණ ගැටළු

මූලික පහසුකම් අඩු වීම /මුඩුක්කු හෝ පේළි නිවාස /සනීපාරක්ෂක පහසුකම් අඩු වීම බීමත්කම හා විවිධ මාදිලියේ අපචාර ඇති වීම

2.පන්ති සහිත සමාජයක් බිහිවීම

3.පරිසර දූෂණය ය

කර්මාන්ත ශාලාවලින් බැහැර කළ අපද්‍රව්‍ය ගංගා ඇළදොළට මුසු වීමෙන් ජල මූලාශ්‍ර අපිරිසිදු වූ අතර කම්හල්වලින් පිට වන දුම් සෞඛ්‍යයට ඉතා අහිතකර වීම

4.කම්කරු ගැටළු

අඩුවේතන, පහත් ජීවන මට්ටම වැඩ කරන කාලය නිශ්චිත නොවීම (ලකුණු 06)